# HDFC බැංකුව

නිවිය මූල්‍ය විසඳුම් හරහා ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු සමස්ත ශ්‍රී ලාංකිකයින්ගේ අභිලාෂ ඉටු කර ගැනීම සඳහා දශක තුනකට අධික කාලයක් පුරා දැයට මහඟු සේවයක් ඉටු කරන **HDFC** බැංකුව හා සම්බන්ධ වී ඔබේ වෘත්තීය ජීවිතය ඉදිරියට ගෙන යාමට මහඟු අවස්ථාවක් උදා වී ඇත.

බැංකුකරණ ක්ෂේත්‍රයේ සැබෑ වෙනසක් ඇති කිරීමට **HDFC** බැංකුව සූදානමින් සිටින බැවින් පහත සඳහන් තනතුර සඳහා දක්ෂ, ක්‍රියාශීලී, බැංකුකරණ ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අයදුම්කරුවන්ට අප හා එක් විය හැකිය.

**තොරතුරු ආරක්ෂණ තර්ජන විශ්ලේෂක [ශ්‍රේණිය III (2)]**

**වගකීම්**

- ආරක්ෂක විශ්ලේෂණ මෙවලම් භාවිතයෙන් තර්ජන සහ අවදානම් වාර්තා සකස් කිරීම.
- ආයතනික තොරතුරු වත්කම්වල ආරක්ෂක පාලන දැඩි කිරීම සහ සමාලෝචනය කිරීම.
- අවදානම්සහගත තත්ත්වයන් වාර්තා කිරීම හා විසඳුම් යෝජනා කිරීම සහ අඛණ්ඩ ආරක්ෂක ගැටලු හැසිරවීම.
- කාලානුරූපීව මාර්ගගත ආරක්ෂණ හැකියා වර්ධනය කිරීමට සහාය වීම.
- වාර්ෂික අවදානම් සහ පරීක්ෂණ අවශ්‍යතා සඳහා සහාය වීම.
- විවිධ කර්මාන්ත හා විශේෂිත කණ්ඩායම් වෙතින් එල්ල විය හැකි සයිබර් තර්ජන පිළිබඳ බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් අවශ්‍ය පූර්ව ආරක්ෂක ක්‍රියා මාර්ග ගැනීම.
- බැංකු තොරතුරු පද්ධතිවල ආරක්ෂාව සහතික කිරීම, තොරතුරුවල ආරක්ෂාව සම්බන්ධ සිදුවීම්වලට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම හා ස්වයංක්‍රීය ක්‍රම හරහා එල්ල විය හැකි ආරක්ෂක තර්ජන හඳුනා ගැනීමට, පාලනය කිරීමට හා වැළැක්වීමට සහාය වීම.

**සුදුසුකම්**

- තොරතුරු ආරක්ෂාව හෝ සයිබර් ආරක්ෂාව පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.
- Certified Ethical Hacker වැනි අදාළ ආරක්ෂක වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.
- සමාන තනතුරක වසර 5ක සේවා පළපුරුද්දක් තිබීම.
- අවදානම් කළමනාකරණය සහ ආරක්ෂක මෙවලම් පිළිබඳ දැනුම තිබීම.
- විශිෂ්ට විශ්ලේෂණ සහ දෝෂ නිරාකරණ කුසලතා පැවතීම.

**වයස් සීමාව**

- වයස අවුරුදු 45ට අඩු වීම වඩාත් සුදුසු වේ.

සිත් ගන්නා වැටුප් සහ දීමනා හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය**

- විද්‍යුත් පණිවිඩයේ විෂය තීරයෙහි (**Subject**) ඉල්ලුම් කරන තනතුර සඳහන් කරමින් 06.12.2023 දින හෝ එදිනට පෙර තමා පිළිබඳ විස්තර ලබා ගත හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුද සඳහන් කරමින් ඔබගේ ඉල්ලුම් පත්‍රය careers@hdfc.lk යන විද්‍යුත් ලිපිනය වෙත යොමු කළ යුතුය.


HDFC බැංකුව
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැපැල් පෙට්ටිය 2085
කොළඹ 02
දුරකථනය : 0112356800